# සංස්කෘත ආයුර්වේද සාහිත්‍යයේ ආරම්භය හා විකාශය
# [The Origin and development of Sanskrit Ayurvedic Literature]

**Ambagaspitiye Sobhitha**[1]

## Abstract

Every Eastern heritage is based on a connection with folklore or literary sources for its historical emergence. Especially in modern Indian society, the development of many of the existing sciences and fields of study also took place on the branches of the trees of the word that grew in connection with the splendid seed of literature. Vedic literature, which is a precious literary element that spontaneously emerged in the womb of the Eastern world, is a haven for the worl-dfamous literary genre called Sanskrit. In that Vedic literature, various hymns have been used for the prevention of diseases in various Sūktas of the Ṛg Veda. Thus, as the Yajur and Sāman Veda eras passed Atharva Veda era entered, the golden age of Ayurveda, or this medical science, dawned. This research discusses an investigative study on the origin and spread of such Sanskrit Ayurvedic literature. The research problem here is how Ayurvedic literature gradually develop due to the spread of the theistic concepts and generations of sages, which were factors in the development of Ayurvedic literature? In addition, it is hoped to identify the reasons that led to the origin and spread of Ayurvedic literature as research objectives and to create awareness about the Sanskrit Ayurvedic texts that have spread up to the present day based on those reasons. By revealing facts related to that topic, this research is important to improve the interest of scholars in that field and to the editors of ancient texts. The data is analyzed using qualitative research methods and all texts from the earliest texts of Sanskrit Ayurvedic literature to the classical ones are studied. For this, only primary and secondary sources related to Sanskrit Ayurvedic literature are used.

**Keywords**: Atharva Veda, medical science, RiṚg Veda, Sanskrit Ayurvedic literature, Vedic Literature

## හැඳින්වීම

නිරෝගී දිවියක් පවත්වාගෙන යාමට සත්ත්වයාත් මිනිසාත් බෙහෙවින් ප්‍රිය කරති. සත්ව ලෝකයේ රෝගයන්ගෙන් ස්වල්ප ව ජීවත්වීමේ භාග්‍යය සත්ත්වයන්ට ස්වභාවයෙන් ම ලැබී ඇත. එහෙත් මිනිසාට එසේ නිරෝගී ව වාසය කිරීමට තරමක් අපහසු ය. කායික මානසික නීරොගීතාව පවත්වාගෙන යාම වනාහි සෞඛ්‍යය යනුවෙන් හැඳින්වේ. ආරෝග්‍යා පරමා ලාභා යන

1 Temporary Lecturer, Department of Languages, Bhiksu University of Sri Lanka.
E-mail: asobhitha90@gmail.com

බුද්ධ වචනයෙන් ද අර්ථවත් කරන්නේ නීරෝගීභාවය උතුම් ම ලාභය වන බව යි. ලෝකයේ සෑම දෙයකට ම ඉතිහාසයක් ගැබ් ව තිබේ. ලොව සියලු දෙනාගේ ම ගෞරවයට පාත්‍ර වූ ආයුර්වේද සාහිත්‍යයට ද දීර්ඝ වූ ඉතිහාසයක් විද්‍යමාන ය. පෙර දිග ආයුර්වේද සාහිත්‍යය හා අපරදිග වෛද්‍ය ශාස්ත්‍රය මෙන ම චීන, තිබ්බතීය, සියම්, තායිවාන, අරාබි ආදි වෛද්‍ය ශාස්ත්‍ර ගණනාවක් ලොවෙහි විද්‍යාමාන වේ. ඒ අතර සියල්ලන්ගේ ම අවධානය දිනාගෙන ඇත්තේ පෙරදිග භාරතීය ආයුර්වේද සාහිත්‍යය යි.

එහි ආරම්භය මහා බ්‍රහ්මයා දක්වා දිවේ. එය හුදෙක් සාහිත්‍යාත්මක වුව ද යම් විද්‍යාත්මක පදනමක පිහිටා බිහි වූ බවට බටහිර වෛද්‍යවරු පවා පිළිගනිති. මනුෂ්‍ය ජීවිතයකට සිදු විය හැකි සෑම රෝගයකට මෙන් ම ව්‍යසනයකට ද පිළියම් කළ හැකි ප්‍රතිකාර මෙහි අපමණ ය. හුදෙක් කායික රෝග පමණක් නොව මානසික රෝග සඳහා ද ප්‍රත්‍යක්ෂ ප්‍රතිකාර ආයුර්වේදයේ සුලභ ව දක්නට ලැබේ. එසේ හෙයින් සංස්කෘත ආයුර්වේද විද්‍යාව තරම් ලොවට ප්‍රදානය කළ තවත් ශාස්ත්‍රයක් භාරතීය ශාස්ත්‍ර අතර අවිද්‍යමාන ය යන්න මොනවට පැහැදිලි ය. ආයුර්වේද යන වචනය වූ කලී ආයුෂ පිළිබඳ විද්‍යාව හෙවත් දැනීම යන අර්ථයෙන් විග්‍රහ වේ.

ලොව ජීවත් වන සත්වයන්ගෙන් ශ්‍රේෂ්ඨතමයා මිනිසා ය. ඔහු තමන්ට ජීවත් වන්නට අවශ්‍ය පරිදි හාත්පස පරිසරය විපර්යාසයට පත් කරමින් සකස් කර ගනියි. මිනිස් ක්‍රියාකාරීත්වයට පමණක් ම ලොව සියල්ල බිහි ව ඇත්තේ ය යන බොළඳ මතය පෙරදැරි කරගනිමින් ඇතැම් මිනිස්සු අත්තනෝමතික ව ක්‍රියා කරති. එහෙත් මිනිසා ද ප්‍රාණීන් අතුරින් එක් ජීවියෙකි. අන් ප්‍රාණීන්ට ද මිනිසාට මෙන් ම ජීවත් වීමේ අයිතිය උරුම ය. මිනිසාගේ පැවැත්ම උදෙසා ලොව බිහිවූ දෑ අතර ආයුර්වේදය හෙවත් කායික හා මානසික සුවතාව සිදු කිරීමේ ශාස්ත්‍රය වූ කලි පෙරදිග ශාස්ත්‍ර අතර විශිෂ්ටතම වූ එක් ශාස්ත්‍රයකි. එම ආයුර්වේදය ඇසුරු කොට ගෙන මානවයා තම භෞතික හා මානසික ප්‍රවර්තනය සිදු කිරීමට කටයුතු සලසා ගනියි. භෞතික හෙවත් කායික පැවැත්ම සිදු වන්නේ මිනිස් සමාජයේ සම්මත ක්‍රමයට අනුව ය. ආයුර්වේදය පවත්නේ මෙම යහපැවැත්ම පදනම් ව ය. එමෙන් ම ශරීරය පවත්වාගැනීමට අවශ්‍ය ඖෂධ, ව්‍යායාම, යෝග ක්‍රම හා ආහාර ආදිය පිළිබඳ ව පෙර අපරදිග ආයුර්වේද විද්‍යාවන්හි මනාව විශද කෙරේ. සුශ්‍රැත සංහිතාවෙන් ඒ බව වඩාත් පැහැදිලි ව තහවුරු වේ.

"සමදෝෂඃ සමාග්නිශ්ච සමධාතුමලංක්‍රියඃ
ප්‍රසන්නාත්මෙන්ද්‍රියමනාඃ ස්වස්ථ
ඉත්‍යභිධීයතේ"
(ගල්මංගොඩ, 2003:21).

සම ලක්ෂණයන්ගෙන් උපලක්ෂිත වූ දෝෂ, අග්නි, ධාතු, මල ආදි ක්‍රියාවන්ගේ ද, පැහැදුණු ආත්ම, ඉන්ද්‍රිය, වන ආදි අංශයන්ගෙන් ද යුතු පුද්ගලයා ස්වස්ථ හෙවත් නිරෝගී සුවපත් බව කැමැත්තෙක් වන බව ඉහත පද්‍යයෙන් පැහැදිලි කෙරේ. ස්වස්ථතාව ඇතිකරනු වස් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත ආයුර්වේදයේ දක්වා ඇත. ඒ අතර ඖෂධ වර්ග, ව්‍යායාම, මන්ත්‍ර, යෝගාභ්‍යාස, ආචාර, සමාචාර, ආචාරධර්ම ආදි දෑ යෝග්‍ය ය. මේවා හුදෙක් පුද්ගල ස්වස්ථතාව උදෙසා ම නොව මිනිසාගේ මෙලොව, පරලොව අභිවෘද්ධිය පිණිස ද හේතු වේ. මෙම ක්‍රමය ඔසු භාවිතයෙන් ම ලබාගත නොහැකි හෙයින් ඒ සඳහා වෙනත් උපයෝගීතා ද නිර්දේශිත ය. මානසික යහපැවැත්ම සඳහා යෝග භාවනාදී ක්‍රම විශේෂ වේ. පුද්ගලයා, භෞතික ලෝකය, මනස, සමාජය, සංස්කෘතිය, ආගම ආදි සියලු අංගයන්හි මනා පැවැත්මක් ඇති වීම උදෙසා ගැඹුරු සංකල්පනාවක්

වූ ස්වස්ථතාව අත්‍යන්තයෙන් හේතු වේ. එකී දෑ සමාන ව පවත්වා ගැනීමට ආයුර්වේදයෙන් උපදේශ ප්‍රදානය කරන අතර සමතුලිතතාවෙන් තොර වූ කල මිනිසා රෝගයනට ගොදුරු ව දුකට භාජනය වේ.

මානව දිවිය මෙලොව පවතින කාල සීමාව උදෙසා ආයුෂය යැයි ව්‍යවහාර කෙරේ. ආයුෂ (දිගු දිවිය) පිළිබඳ වේදය (උසස් ශාස්ත්‍රය) ආයුර්වේදය යි. (කුමාරසිංහ, 1982:21). එමෙන් ම උවදුරකින් තොර ව දිගාසිරි ලබා ගැනීමේ ක්‍රමය විවරණය කොට ඇති ශාස්ත්‍රය ආයුර්වේදය වශයෙන් සුප්‍රකට ය. ආයුෂ් ශබ්දයට පර්යාය ශබ්ද ලෙස ජීවන, චිරජීවනය, ධාරී, ත්‍යාග, අනුබද්ධ යනාදී පද ද භාවිත වේ. අර්ථය දැන ගැනීම හෙවත් ඥානය යන්න අර්ථවත් කරන √විද් ධාතුවෙන් නිපන් කෘදන්තයක් වශයෙන් වේද යන්න හැඳින්වේ. "අයහපත් දෙය බැහැර කොට යහපත වැලඳ ගැනීමට අවශ්‍ය වන උතුම් උපදෙස් පරපුර" යන අර්ථය වේද යන පෞරාණික වචනයෙන් අර්ථවත් කෙරේ. අනුශාසනය, විද්‍යාව, ශාස්ත්‍රය නමැති අරුත් ද එහි ගැබ් වේ. ආයුෂයට හිත හා අහිත දේ ද රෝගයනට ප්‍රත්‍ය වන හා රෝග සංසිඳු වන උපාය ද විස්තර කොට ඇති පරම ශාස්ත්‍රය ආයුර්වේදය ශාස්ත්‍රය යි.

### සාහිත්‍ය විමර්ශනය

සංස්කෘත ආයුර්වේද සාහිත්‍යය සම්බන්ධයෙන් විද්‍යමාන සාධක ප්‍රමාණවත් තරම් සාහිත්‍ය ක්ෂේත්‍රයේ දක්නට ලැබේ. ඒ අතුරින් මෙම පර්යේෂණය සඳහා සංස්කෘත භාෂා මාධ්‍යයන්ගෙන් ලියවුණු ප්‍රාථමික මූලාශ්‍රය ද සිංහල සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් ලියවුණු ද්විතීයික මූලාශ්‍රය ද පරිශීලනය කෙරිණි. එම මූලාශ්‍රය ඇසුරින් ආයුර්වේද සාහිත්‍යයේ ආරම්භය සහ විකාශනය පිළිබඳ විමර්ශනාත්මක ව අධ්‍යයනය කළ හැකි ය. එම අධ්‍යයනය කිරීම ඔස්සේ ආයුර්වේද සාහිත්‍යයේ සම්භවයට හේතු වූ මූලාශ්‍රයාගත සාම්ප්‍රදායික මත පිළිබඳ විශ්ලේෂණය කෙරේ. තදනන්තර ව ඍෂි පරම්පරානුගත ව ගුරු - ශිෂ්‍ය සංයෝගයෙන් ඒ ඒ යුග පසුකරමින් නූතනය දක්වා සංවර්ධනය වූ අයුරු පිළිබඳ ස්වාධීන අධ්‍යයනයක් වශයෙන් කරුණු ගවේෂණය කෙරේ.

### පර්යේෂණ ගැටලුව

සංස්කෘත සාහිත්‍යයෙහි විද්‍යමාන විවිධ සාහිත්‍යාංග අතර ආයුර්වේද සාහිත්‍යය අධ්‍යයනය විෂයෙහි ප්‍රාථමික මූලාශ්‍රය පිළිබඳ තොරතුරු සමීක්ෂණයෙහි ලා ද්විතීයික මූලාශ්‍රය පාදක වන්නේ කවරාකාරයෙන් ද? ආයුර්වේද සාහිත්‍යය විකාශන උදෙසා සාධක වූ දේවවාදී සංකල්ප සහ ඍෂි පරම්පරාවන්හි ව්‍යාප්තිය හේතුවෙන් ක්‍රමික ව ආයුර්වේද සාහිත්‍යය ප්‍රවර්ධනය වූයේ කෙසේ ද?

### පර්යේෂණ අරමුණු

ආයුර්වේද සාහිත්‍යයේ ආරම්භය සහ විකාශයට තුඩු දුන් හේතු සාධක හඳුනා ගැනීම සහ එම හේතු සාධක පදනම් ව නූතනය දක්වා විකාශය වූ සංස්කෘත ආයුර්වේද ග්‍රන්ථ පිළිබඳ පරිඥානයක් ඇති කරවීම

### පර්යේෂණ වැදගත්කම

සංස්කෘත ආයුර්වේද සාහිත්‍යයේ ආරම්භය සහ විකාශය සම්බන්ධ ව කරුණු අනාවරණය කිරීමෙන් සංස්කෘත ආයුර්වේද ක්ෂේත්‍රය විෂයෙහි විද්‍යාර්ථීන්ගේ උනන්දුව වැඩි දියුණු කිරීමට හා පෞරාණික ග්‍රන්ථ සංස්කරණාදියට හේතු වේ.

### පර්යේෂණ සීමා

සංස්කෘත ආයුර්වේද සාහිත්‍යයේ ආදිතම ග්‍රන්ථ වන වෘද්ධත්‍රයී සහ ලඝුත්‍රයී ග්‍රන්ථයන්ගේ සිට සම්භාව්‍ය ගණයෙහි ලා ගැනෙන භේල සංහිතා, කාශ්‍යප

සංහිතා, කල්‍යාණකාරක, අස්ටාංගසංග්‍රහය යන ග්‍රන්ථ සහ පුරාණ මෙන් ම ආගමික සාහිත්‍යයට අයත් වෛද්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථ පිළිබඳ අධ්‍යනය කරන අතර මේ සඳහා සංස්කෘත ආයුර්වේද සාහිත්‍යය සම්බන්ධ ව රචනා වූ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පමණක් යොදාගැනේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය සිදු කරන්නේ ගුණාත්මක පර්යේෂණ (Qualitative Research) ක්‍රමවේදය යටතේ ය. එහි දී දත්ත රැස්කරනු ලබන්නේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරු කිරීමෙනි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ආයුර්වේද සාහිත්‍යයෙහි සම්භාව්‍ය කෘති අධ්‍යයනය සහ ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මෙම මාතෘකාව සහ බැඳි ශාස්ත්‍රීය කෘති, ලිපි මෙන් ම අන්තර්ජාලය ආදි ක්‍රමවේද දත්ත රැස්කිරීම උදෙසා උපයෝගී කරගනු ලැබේ.

## සාකච්ඡාව

### ආයුර්වේදයේ ආරම්භය

ජන සමාජයේ පරිණාමය හේතුකොට ගෙන මිනිසාට යහපත් හා අයහපත් තත්වයන් කලින් කල ප්‍රගමනය විය. ඒ අතර පුද්ගල පරිහානියට හේතුවන දෑ ද අපමණ ය. එහෙත් පුද්ගල යහපතට හේතු වන දෑ බොහෝ සෙයින් බිහි වන්නේ ය යන්න ප්‍රත්‍යක්ෂ ය. පුද්ගලයා තම තෘෂ්ණාව පදනම් කරගෙන විවිධ අධාර්මික ක්‍රියා පසු පස ගමන් කරයි. ඒ හේතුවෙන් සොරකම, කාම මිථ්‍යාචාරය ආදි සමාජ ප්‍රචණ්ඩ ක්‍රියා හටගනියි. මිනිසා දීර්ඝ කාලයක් තිස්සේ පුරුදු කර ගෙන ආ ආචීර්ණ කල්ප දුෂ්ක්‍රියා ඇතැම් විට සංස්කෘතියක් හා සම්ප්‍රදායක් බවට පත් වේ. සත්තේ වෙපුල්ලං ගතෙ තේසං සත්තානං ආයුම්පි පරිහායි. වණ්ණෝපි පරිහායි. යන චක්කවත්ති සිහනාද සූත්‍රාගත පාඨයට අනුව මනුෂ්‍යයා ආයුධ, වසවිෂ ආදියෙන් සන්නද්ධ වූ කල ඔහුගේ ආයුෂය ද වර්ණය ද පරිහානිය කරා ගමන් කරයි. රෝගයක් හටගත් කල්හි එම රෝගයට පිළියම් යෙදීමේ අවශ්‍යතාව ද පැන නගින්නේ නිරායාසයෙනි. එම අවශ්‍යතාවේ ක්‍රමානුකූල ව්‍යාප්තිය ආයුර්වේදයේ ඉතිහාසය වශයෙන් පැහැදිලි ව හඳුනා ගත හැකි ය.

එවැනි රෝගී තත්වයනට පිළියම් සෙවූ ශාඛාවක් ලෙස ආත්‍රේය සම්ප්‍රදාය ප්‍රකට ය. එකල ඇති වූ මෙම දුර්භාග්‍යය තත්වයට පිළියම් සොයනු වස් ආධ්‍යාත්මික වශයෙන් දියුණුවක් ලබා සිටි ඍෂිවරුන් හිමාලයට රැස් ව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අවසන් තීරණය වූයේ මේ උදෙසා නිවැරදි ම විසඳුම ලබා දෙන තැනැත්තා වූ ඉන්‍ද්‍ර වෙත භාරද්වාජ ඍෂිවරයා යොමු කිරීමට ය. භාරද්වාජ තෙමේ ඉන්‍ද්‍ර හමු වී ආයුර්වේද ශාස්ත්‍රය සැකවින් හදාළහ. එම ශාස්ත්‍රය වනාහි රෝග හේතු, රෝග ප්‍රතිකාර හා යෝග්‍ය ඖෂධ ආදියෙන් සමන්විත වූවකි. භාරද්වාජගෙන් මෙම ශාස්ත්‍රය උගත් පුනර්වසු, ආත්‍රේය යන දෙදෙනා තම සිසුන් සයදෙනාට එය ඉගැන්වූහ. ඔවුන් අතුරින් අග්නිවේශ පළමුවෙන් ම ආයුර්වේද ග්‍රන්ථයක් රචනා කළේ ය. තදනන්තර ව අනෙක් ශිෂ්‍යයෝ ද ආයුර්වේද ග්‍රන්ථ රචනා කිරීමෙහි නිරත වූහ. සම්පාදිත ඒ සියල්ල යථෝක්ත ඍසි සම්මේලනයේ දී ඍසිවරුන් අභියස ප්‍රකාශ කිරීමෙන් පසු නියම වශයෙන් සංග්‍රහ කිරීම සඳහා අනුමත විය.

ආත්‍රේයගේ ඉතිහාස කතාවට අනතුරු ව ධන්වන්තරීගේ ඉතිහාස කතාවක් ද විද්‍යමාන වේ. සුශ්‍රැත සංහිතාවේ සඳහන් වන පරිදි එකල බරණැස් නුවර රජ වූ දිවෝදස ධන්වන්තරී නම් රජු ආයුර්වේදය ඉගැන්වීම සඳහා දෙවියෙකු වශයෙන් සිට, මනු ලොවයේ පහළ වූ රජෙකි. ශාරීරික, මානසික හා ස්වභාවික යන ආගන්තුක රෝගයන්ගෙන් පීඩාවට පත් මිනිසුන් දුටු සුශ්‍රැත ඍෂිවරයා ප්‍රධාන ඍසිවරුන්,

ආයුර්වේදය උගන්වන්නැයි ධන්වන්තරී රජුගෙන් ආයාචනා කළ හෙයින් රජු එය ඉටු කළේ ය. සුශ්‍රැත සංහිතාවේ දැක්වෙන පරිදි බ්‍රහ්මන් විසින් ශ්ලෝක ලක්ෂයකින් පරිමිත ව දෙසූ ආයුර්වේදය අථර්ව වේදයේ කොටසක් වශයෙන් සංග්‍රහ වී ඇත්තේ ය යන්න විද්වත් මතය යි. එමෙන් ම ආයුර්වේදය අථර්ව වේදය සමඟ සම්බන්ධතාවකින් යුක්ත බව සුශ්‍රැත සංහිතාවෙහි ම සඳහන් වේ. තත් කාරණය පසක් කරමින් ''චතුර්ණාමෘත සාමය ජුර්වේදානාමථර්ව වේදෙ භක්ති රාජදේශයා'' ආදි වශයෙන් චතුර්වේදය හා පවතින සම්බන්ධතාව දක්වමින් අථර්ව වේදයට එහි විද්‍යමාන ඍජු සම්බන්ධය පෙන්වා දී ඇත. (ගුප්තා, 2003:57). ආයුර්වේදය කෙසේ උපන්නේ ද? යන පැනයට පිළිතුරු වශයෙන් කාශ්‍යප සංහිතාවේ ද 'අථර්වවේදොපනිෂත්සු ප්‍රාගුත්පන්නඃ' යනුවෙන් අථර්වවේදය ම ආයුර්වේදයෙහි මූලය වේ ය යන්න තහවුරු කරවන්නට උත්සාහ දරයි. සුශ්‍රැත සංහිතාවේ දැක්වෙන ආකාරයට ආයුර්වේදය අංග අටකින් උපලක්ෂිත ය. එය මෙසේ ය. (ගුප්තා, 2003: 57).

1. ශල්‍ය
2. ශාලාක්‍ය
3. කායචිකිත්සා
4. භූතවිද්‍යා
5. කෞමාරභෘත්‍ය
6. අගදතන්ත්‍ර
7. රසායනතන්ත්‍ර
8. වාජීකරණතන්ත්‍ර

එසේ ම ආයුර්වේදයේ සමුද්භවය පිළිබඳ ධන්වන්තරී රජුගේ විශ්වාසය වඩාත් ප්‍රකට වූවකි.

බ්‍රහ්මා ස්මෘත්වායුෂෝවේදං ප්‍රජපතිරපිග්‍රහත්,

සෝ'ශ්විනෞ තෞ සහස්‍රාක්ෂම් සෝ'ත්‍රිපුත්‍රාදිකාන් මුනීන්

තේ'ග්නිවේශාදිකාංස්තේ තු පෘථක් තන්ත්‍රාණි තේනිරේ. (Aṣtānga Hṛdaya of vāgbhaṭa, Sūtrasthāna:2013).

ආයුර්වේදය මහා බ්‍රහ්මයාගෙන් බිහි වූ බවත් ඔහුගෙන් ප්‍රජාපති ද ප්‍රජාපතීගෙන් අශ්වින් කුමාරවරු දෙදෙනා ද ඔවුන්ගෙන් ඉන්ද්‍ර ද ඉන්ද්‍රගෙන් ධන්වන්තරී රජු අතට පත් වූ බවත් සුශ්‍රැත සංහිතාවේ හා අෂ්ටාංග හෘදයසංහිතාවේ ද විද්‍යමාන වේ. එමෙන් ම ධන්වන්තරී රජු දෙව්ලොව සිටින කල දෙවියන්ට ප්‍රතිකාර කළ දෙවියෙක් වශයෙන් ද මනු ලොව උපන්නේ එම ශාස්ත්‍රය මිනිසුන්ට අවබෝධ කරවීමේ අරමුණ සහිත ව ය යන්න මෙහි ම දැක්වේ. (ගල්මංගොඩ, 2003:3). කායික වශයෙන් මෙන් ම මානසික වශයෙන් ද මිනිසා කරා රෝග පැමිණෙයි. එසේ කායික ව පැමිණෙන රෝග අටක් ආයුර්වේදයේ හඳුනාගෙන ඇති අතර ඒවා අෂ්ටාංගායුර්වේදය යනුවෙන් නාමකරණයට ලක් වේ.

1. කාය චිකිත්සා - ශාරීරික අභ්‍යන්තර රෝග ප්‍රතිකාර
2. ශල්‍යතන්ත - ශල්‍ය කර්ම
3. ශාලාක්‍යතන්ත්‍ර - හිස සහ බෙල්ල පිළිබඳ ප්‍රතිකාර
4. අගදතන්ත්‍ර - විෂ වෙදකම
5. භූතවිද්‍යා - අමනුෂ්‍ය උපද්‍රව සහ මානසික රෝග ප්‍රතිකාර
6. බාලතන්ත්‍ර - ළමාරෝග ප්‍රතිකාර
7. රසායනතන්ත්‍ර - මහලු වයස හා සම්බන්ධ රෝග

8. වාජීකරණතන්ත්‍ර - තාරුණ්‍ය වර්ධනය කිරීම පිළිබඳ ප්‍රතිකාර, කාමෝද්දීපන ප්‍රතිකාර

ආදි වශයෙන් ආයුර්වේදයේ ඉතිහාසය පිළිබඳ පෞරාණික ග්‍රන්ථයන්හි සැකෙවින් විග්‍රහ වේ. එසේ වුව ද ආයුර්වේද සාහිත්‍යය හුදෙක් වේද හා ආයුර්වේද ග්‍රන්ථයනට පමණක් පටු නොවී පාණිනිගේ අෂ්ටාධ්‍යායි ව්‍යාකරණයට ද මහාභාරත රාමායණාදි වීර කාව්‍යයට ද ලෞකික සාහිත්‍යයට ද පැමිණ එහි ඉතිහාසය සම්බන්ධ ව තොරතුරු රැසක් තත් ග්‍රන්ථයන්හි ජනිත කොට ඇත. එමෙන් ම ආයුර්වේදය සාහිත්‍යයක් වශයෙන් රචනා වූයේ සංහිතා රචනා වූ කාලයේ ම වි ය. ආයුර්වේද සාහිත්‍යය ම අළලා ග්‍රන්ථ රැසක් රචිත නමුත් උක්ත ආයුර්වේද අංග අට සහිත ව රචනා වී ඇත්තේ අල්ප ග්‍රන්ථ ප්‍රමාණයකි. ඒ අතර ආයුර්වේද ක්ෂේත්‍රය මුල් කරගෙන කරන ලද ප්‍රධාන ග්‍රන්ථත්‍රයකි. ඒවා වෘද්ධත්‍රයී ග්‍රන්ථ වශයෙන් හැඳින්වේ. එනම්

1. චරකසංහිතා

2. සුශ්‍රැතසංහිතා

3. අෂ්ටාංගහෘදයසංහිතා වශයෙනි.

ලඝුත්‍රයී නාමයෙන් හඳුන්වන වැදගත් ආයුර්වේද කෘතිත්‍රයක් ද අයුර්වේද සාහිත්‍යයේ අලංකාරයට ප්‍රස්තුත විය. ඒවා

1. මාධවනිදාන

2. ශාරඞ්ගධර සංහිතා

3. භාවමිශ්‍ර නිඝණ්ටු (භාවප්‍රකාශ) වශයෙන් හැඳින් වේ.

ඉන්ද්‍ර, මරුත් ආදි දෙවිවරු, වෛද්‍යවරු වශයෙන් ඍග්වේදයේ ප්‍රකාශිත ය. අශ්වින් දෙදෙනා ශ්‍රේෂ්ඨත්වයේ සංකේත වශයෙන් සැලකේ. එහි ම දැක්වෙන පරිදි ඉන්ද්‍රගේ චිකිත්සා ක්‍රම ඉතා ප්‍රශස්ත ය. අපාලා නම් ආර්ය කාන්තාවකගේ චර්ම රෝගය හා ඇයගේ පියාගේ චර්ම රෝගය සුව කිරීම, අන්ධ පරාවෘජ් නමැත්තාට දෘෂ්ටිය ලබාදීම, කොර වූ ශ්‍රෝණට සුවය ලබා දීම ආදිය ඒ අතර විශේෂ වේ (ගුප්තා, 2003:58). තදනන්තර ව ඉන්ද්‍රගේ ඔසු ධාරණය, නොයෙක් විෂ හා කෘමීන් පිළිබඳ වර්ණනා හා ඒවාට ප්‍රතිකාර, නොයෙක් ආකාර ක්ෂය රෝග ප්‍රතිකාර, සූර්ය චිකිත්සාවෙන් හෘද රෝග සුව කිරීම, ජලයේ පවතින ඖෂධීය ගුණය, ඖෂධ වර්ණනා, ක්ෂය රෝග (යක්ෂ්මා), හඳුනා නොගත් ක්ෂය රෝග (අඥාත යක්ෂ්මා), රාජ යක්ෂ්මා (ක්ෂය රෝගය), පිටවක සන්නිය (පෘෂ්ඨයාමාස) හා හෘද රෝග පිළිබඳ ව ද සඳහන් වේ (ගුප්තා, 2003:58). එසේ ම ඖෂධ බඳින ස්ථාන, ඖෂධවල ස්වරූපය, ඖෂධ වර්ගීකරණය වැනි දෑ පිළිබඳ ඍග්වේදයේ දීර්ඝ විස්තරයක් දක්නට ලැබේ. ඖෂධවල රෝග නාශකත්වය, ඖෂධ ගවේෂකයන් හා යමක් සඳහා ඖෂධ සොයන්නන් යන දෙදෙනා සඳහා උපකාර වීම, ශ්ලේශ්මල රෝග, ශෝථය, අර්සස්, ඉදිමුම (ශ්මයථු), බරවා (ශ්ලීපද-සෙක්‍රස්), මුඛය පැසවීම (මුඛපාත), තුවාල ආදි රෝග සුව කිරීම, මිනිසුන්ගේ හා අශ්වයන්ගේ ශරීරාංගයන්හි තැනින් තැන පරීක්ෂාව, කැස්ස, තඩිස්සි වීම, අර්ශස්, කොළරාව, හෘද රෝග, අක්ෂි රෝග, චර්ම රෝග, කුෂ්ට රෝග ආදී රෝග පිළිබඳ ශුක්ල ආයුර්වේද සංහිතාවේ දොළොස් වැනි අධ්‍යායේ සූක්ත දෙකක සඳහන් වේ. එමෙන් ම දෘෂ්ටිය ලැබීම, ක්ෂය රෝග, උන්මාදය ආදියට ප්‍රතිකාර තෛත්තරීය සංහිතාවේ දැක්වේ (ගුප්තා, 2003:59).

සෙසු වේද ග්‍රන්ථවලට සාපේක්ෂ ව අථර්ව වේදයේ රෝග ප්‍රතිකාර ක්‍රම පිළිබඳ බොහෝ සෙයින් කරුණු දැක්වේ (ගුප්තා, 2003:60). එහෙත් ඓතිහාසික කරුණු දැක්වීමෙන් ඍග්වේද සූක්තවලට හාත්පසින් අථර්ව වේද සූක්ත වෙනස් ය. අථර්ව වේදයයෙහි

රෝග හා ප්‍රතිකාර ක්‍රම පිළිබඳ සූක්ත සිය ගණනකින් තොරතුරු සඳහන් වේ (කුමාරසිංහ, 1982:38-43). ත්‍රිදෝෂවාදය ප්‍රමුඛ කොට ගෙන අථර්ව වේදයෙහි මූලික සිද්ධාන්ත රඳා පවතියි. ආයුර්වේදයෙහි වා, පිත්, සෙම් රෝග පිළිබඳ සඳහන් වන අතර අථර්වවේදයේ හුදෙක් භූත විද්‍යාව ප්‍රමුඛ කොට වෙදකම ද මිශ්‍ර ව ආයුර්වේද ක්‍රම රචනා විය. එමෙන් ම ප්‍රසූති විඥානය (ස්ත්‍රී ප්‍රජනනය හා සම්බන්ධ තොරතුරු) විෂ විඥාන (විෂ ඉවත් කිරීම සඳහා භාවිත මන්ත්‍ර) ශල්‍ය-ශාලාක්‍ය (ශල්‍ය කර්ම පිළිබඳ විස්තර) භූත විද්‍යා, රසායන (ආයුෂ වඩන නොයෙක් මන්ත්‍ර) වාජීකරණ (කාම ශක්තියෙහි වර්ධනය හා පුරුෂ ශක්තියෙහි වර්ධනය සඳහා ප්‍රතිකාර) යන ශාස්ත්‍ර පිළිබද ව පුළුල් විග්‍රහයක් අන්තර්ගත ය.

## පුරාණ ග්‍රන්ථාගත ආයුර්වේද සාහිත්‍යය

තව ද වේද ග්‍රන්ථයන්හි පමණක් නොව බ්‍රාහ්මණ, පුරාණාදි ග්‍රන්ථයන්හි ද ආයුර්වේදය විෂයෙහි සාක්ෂි එමට ය. ඓතරීය බ්‍රාහ්මණයේ ශරීරයේ උපත හා ප්‍රාණය මෙන් ම චිකිත්සා ක්‍රම පිළිබඳ ව ද වර්ණිත ය. තදනන්තර ව අශ්වීන් දෙදෙනාගේ දේව විද්‍යාත්මක නිර්දේශ, ඥානේන්ද්‍රිය වර්ධනය (5/22), ඖෂධීන්ගේ රෝග නිවාරණය (3/40), අඳුනින් ඇස් රෝග සුව වන ආකාරය (1//3), ශාපයෙන් උන්මාද කුෂ්ට ආදිය නිපදවීම, ශුනඃශේප කථාවෙහි විද්‍යමාන වරුණගේ කෝපයෙන් ජලෝදර රෝගය ඇතිවීම අදිය කරුණු සහිත ව විරචිත ය (කුමාරසිංහ, 1982:43). එමෙන් ම පුරාණ සාහිත්‍යයේ ද ආයුර්වේදය පිළිබඳ තොරතුරු දැකගත හැකි ය. ඒ අතර පුරාණ ග්‍රන්ථ කිහිපයක් විශේෂ වේ.

විෂ්ණු පුරාණයේ ගෘහ දිවිය ගතකළ යුතු ආකාරය දැක්වීමේ දී හා විවාහයේ දී අනුගමනය කළ යුතු න්‍යාය, දෛනික දිවියේ ශාරීරික ඇවතුම් පැවතුම්, ආහාර ගැනීමේ දී අනුග මනය කළ යුතු දෑ, ස්ත්‍රීන් හා ගනුදෙනු කරන කල්හි සෞඛ්‍යාරක්ෂිත විය යුතු ආකාරය පෙන්වා ඇත. (කුමාරසිංහ, 1982:49). තව ද අග්නි පුරාණයේ ගජතුරඟ චිකිත්සා, වක්ෂායුර්වේදය, සිද්ධෞෂධ, සර්ව රෝග හර ඖෂධ, මන්ත්‍රරූෂ ඖෂධ, මෘතසංජීවනකාරී සිද්ධයෝග ආදිය පිළිබඳ දැක්වේ (ගුප්තා, 2003:81-97). පද්මපුරාණයේ දැක්වෙන පරිදි සියලු රෝගයනට අධික ව කුසගින්න බලවත් බවත්, මාර්තණ්ඩ භානුගේ කුෂ්ට රෝග යනුත්, ගරුණගේ ජලෝදර හා පූෂන්ගේ දන්ත ක්ෂය වීමේ විකල බව යන සියල්ල අශ්වින්ගේ චිකිත්සා චතුර්ථයෙන් සුවපත් කළ බවත් සඳහන් වේ (ගුප්තා, 2003:100). බ්‍රහ්මවෛවර්ත පුරාණයේ දැක්වෙන්නේ ප්‍රජාපති සිව්වේදය ම අධ්‍යයනය කොට එහි වෛද්‍ය ශාස්ත්‍රයට සම්බන්ධ සියල්ල ගෙන පඤ්චම වේදය වූ ආයුර්වේදය නිර්මාණය කළ බව යි. එය මුල් කරගෙන භාස්කර විසින් භාස්කර සංහිතා නම් නව කෘතියක් රචනා කළ අතර ඔහුගේ අනුගාමිකයන් දහදෙනා ද වෙන් වෙන් ව ග්‍රන්ථ රචනා කළහ. බ්‍රහ්ම විසින් භාස්කරට ආයුර්වේද ශාස්ත්‍රය ලබා දුන් බව පැහැදිලි කෙරේ. ගරුඩ පුරාණයේ වා, පිත්, සෙම් කෝපයට හේතු, එසේ වීමෙන් ඇති වන තත්වයන් හා චිකිත්සා ක්‍රම ආදිය පිළිබඳ ද කරුණු සඳහන් ය. ස්කන්ධ පුරාණයේ ආරෝග්‍යශාලා සංවිධානයට හා ඒවා නිර්මාණය කරන්නාවුනට උපදේශ දානය මොනවට විශද වේ (කුමාරසිංහ, 1982:49). ලිංග පුරාණයේ විවිධ රෝගත්පත්ති හා සර්පයන් පිළිබඳ සඳහන් ය. වාමන පුරාණයේ ජ්වර, ව්‍රණ, කුෂ්ට, විසූචිකා යන චිකිත්සා ක්‍රම විග්‍රහා කෙරේ. සූර්ය පුරාණයේ සංජිවනි විද්‍යාව පිළිබඳ වර්ණනා, දානය හේතු කොට ගෙන රෝග නැසීම, ඖෂධ ප්‍රදානයේ අනුහස් හා අන්ධතා, බධිරතා, ශිරෝරෝග, ජ්වර, ශූල, යක්ෂ්ම, මූර්ජා, භ්‍රම ආදිය විෂයෙහි කරුණු බොහෝමයකි (කුමාරසිංහ, 1982:48).

තදනන්තර ව සාංඛ්‍ය, යෝගාදි ෂට් දාර්ශනික ග්‍රන්ථයන්හි ද ආයුර්වේදයේ සංවර්ධනය සිදු වූ ආකාරය කෙරෙහි තොරතුරු බොහෝ ය. මෙකල අථර්ව වේදාගත මන්ත්‍ර ක්‍රම අංශ දෙකකට අනුයුක්ත ව වර්ණනා වී ඇත. එමෙන් ම භූත විද්‍යා, සර්ප විද්‍යා, රසායන හා වාජීකරණ යනුවෙන් ප්‍රතිකාර ක්‍රම 4ක් විද්‍යමාන වේ. භූත විද්‍යා, අගද තන්ත්‍ර, වාජීකරණ තන්ත්‍ර ආදිය අථර්වවේදයටත් ආයුර්වේදයටත් පොදු ය (ගල්මංගොඩ, 2003:12). එකල ආයුර්වේදයට පමණක් ශාස්ත්‍ර වශයෙන් ශල්‍ය, ශාලාක්‍ය, කාය චිකිත්සා, කෞමාරභෘත්‍යය යන අංග විශේෂිත විය. පූර්ව යුගයේ ඖෂධ භාවිත වූයේ අද්භූත හා ආගමික පදනමින් වුව ද ෂට් දර්ශනය බිහි වූ පසු ඖෂධ යනු ප්‍රත්‍යක්ෂ මෙන් ම තාර්කික ව පිළිගත යුතු දෑ වශයෙන් ප්‍රකට විය. එසේ වුව ද ආත්‍රේය හා සුශ්‍රැත යන ප්‍රධාන ශාඛා ද්වය ඔස්සේ ආයුර්වේද සාහිත්‍යය සංවර්ධනය වූ විෂය ක්ෂේත්‍රයකි.

**ආයුර්වේද සාහිත්‍යාගත කෘති**

**චරක සංහිතා**

පැරණිත ම ආයුර්වේද ග්‍රන්ථය වන මෙහි කතුවරයා ආත්‍රේය සම්ප්‍රදායට අයත් අග්නිවේශ ඍෂිවරයා ය. ආත්‍රේයගේ සිසුන් සයදෙනාගෙන් එකෙකු වූ අග්නිවේශ මෙය රචනා කරන ලද අතර ක්‍රි.ව. එකොළොස් වන සියවසේ දී ද එය පැවැතියේ යැයි චක්‍රපාණිදත්ත සිය ටීකාවේ දක්වයි (ගල්මංගොඩ, 2003:13). මෙම ග්‍රන්ථයේ ඌන පූරණය පශ්චාත් කාලීන ව චරක හා දෘඪබල විසින් කරන ලදි. එය සිදු වී ඇත්තේ අග්නිවේශ රචනා නො කළ චිකිත්සා ස්ථානයේ පරිච්ඡේද 17ක් ද කල්ප හා සිද්ධිස්ථාන ද දෘඪබල විසින් රචනා කිරීමෙනි. මෙහි කාලය වශයෙන් පිළිගැනෙන්නේ ක්‍රි.පූ. 2 වන සියවස හා ක්‍රි.ව. 2 වන සියවස අතර කාලය යි. මෙම ග්‍රන්ථයෙහි ආරම්භයේ ම දක්වා ඇත්තේ ආයුර්වේදයේ ආරම්භකයා වශයෙන් ආත්‍රේය පුනර්වසු තෙමේ ය. එසේ හෙයින් චරක සංහිතාව පරම්පරා ගණනාවකට ම අයත් කෘතියක් වශයෙන් පිළිගත හැකි ය. (ගල්මංගොඩ, 2003:13).

1. ආත්‍රේය පුනර්වසු- (ආයුර්වේදය අවබෝධ කොට ප්‍රකාශ කළේ ය.)
2. අග්නිවේශ - (සංග්‍රාහකයා)
3. චරක - (සංස්කාරකවරයා)
4. දෘඪබල (නැවත සංස්කරණය කළේ ය.)

එමෙන් ම චරක සංහිතාවේ අෂ්ට ස්ථාන අධ්‍යාය 120කින් සකසා ඇත. (ගල්මංගොඩ, 2003:491). ඒවා පහත පරිදි වේ.

1. සූත්‍ර ස්ථාන අධ්‍යාය 30කි.
2. නිදාන ස්ථාන අධ්‍යාය 08කි.
3. විමාන ස්ථාන අධ්‍යාය 08කි.
4. ශාරීර ස්ථාන අධ්‍යාය 08කි.
5. ඉන්ද්‍රිය ස්ථාන අධ්‍යාය 12කි.
6. චිකිත්සා ස්ථාන අධ්‍යාය 30කි.
7. කල්ප ස්ථාන අධ්‍යාය 12කි.
8. සිද්ධි ස්ථාන අධ්‍යාය 12කි.

මේවායෙහි ආයුර්වේදයේ ආරම්භය, ආයුර්වේද දර්ශනය, රෝග, ඖෂධ සංයෝගය, ශරීර රචනා ආදි කරුණු රැසක් ම දක්නට ලැබේ.

**සුශ්‍රැත සංහිතා**

සුශ්‍රැත සංහිතාව ධන්වන්තරී ගුරුකුලයට අයත් ග්‍රන්ථයකි. මෙහි සැකැස්ම දෙස බැලූ කල විද්‍යමාන වන්නේ මෙය සංස්කරණ ගණනාවකට ලක් වූ කෘතියක් වශයෙනි. වර්තමානයේ දක්නට ඇත්තේ ද එහි මුල් පිටපත නො වේ. වර්තමාන සුශ්‍රැත

සංහිතාවේ මූලික ශල්‍ය තන්ත්‍රයේ සූත්‍ර, නිදාන, ශරීර, චිකිත්සා, කල්ප යනුවෙන් කොටස් තුනක එකතුවක් දක්නට ලැබේ. මුල් කල ධන්වන්තරීගේ උපදෙස් මත සුශ්‍රැත විසින් මෙය සැකසූ අතර පසු ව සංස්කරණය වි ය. (The Suśruta Saṃhitā. 1907:Introduction.) නාගාර්ජුන හිමි මෙහි තෘතීය සංස්කාරකයා ය. වර්තමාන තත්වයට පත් කරන ලද්දේ ක්‍රි.ව. 10 වන සියවසේ වාසය කළ චන්ද්‍රට නැමැත්තා විසිනි. මෙහි ශල්‍ය වෛද්‍ය විද්‍යාව ප්‍රධාන වන අතර ඒ සඳහා උපකරණ සියයකටත් අධික සංඛ්‍යාවක් නම් කොට තිබීමෙන් එකල තාක්ෂණයේ දියුණුව පිළිබඳ තතු අනාවරණය කෙරේ.

#### අෂ්ටාංග හෘදයසංහිතා

ධන්වන්තරී හා ආත්‍රේය ගුරුකුල ද්වයෙන් කායචිකිත්සා පිළිබඳ ශාස්ත්‍රය ප්‍රණීත කෙරිණි. ඒ අතුරින් චරක හා සුශ්‍රැතසංහිතා යන ග්‍රන්ථ ප්‍රමුඛ වේ. එහෙත් එහි දිගුවක් වශයෙන් බිහි වූ එකදු ග්‍රන්ථයක් හෝ නො මැත. එම ඌන පූරණය සිදු කරනු වස් සිංහගුප්තගේ පුතු වාග්භට තෙමේ සම්ප්‍රදායන් දෙකෙහි ම විසිර තිබූ දෑ ඒකරාශී කොට, නොයෙක් ග්‍රන්ථවලින් ද කරුණු ගෙන ආයුර්වේදයේ අංග 8 නිර්මාණය කොට අෂ්ටාංග හෘදයසංහිතාව සමාප්ත කළේය (ගල්මංගොඩ, 2003:501). කතුවරයා ග්‍රන්ථාරම්භයේ බුදුරදුන්ට නමස්කාර කොට ඇති හෙයින් බෞද්ධයෙකු යැයි පිළිගැනේ. මොහුගේ පියා වූ ජ්‍යෙෂ්ඨ වාග්භට විසින් අෂ්ටාංගසංග්‍රහ නම් ග්‍රන්ථයක් ද රචනා කළ අතර එයට වඩා අෂ්ටාංග හෘදයසංහිතාව සරල වූ හෙයින් ජනප්‍රිය විය. ලංකාවාසි සංඝරාජ අනෝමදස්සි හිමිගේ භේසජ්ජමංජූසා නම් ග්‍රන්ථය ද අෂ්ටාංග හෘදයසංහිතාව ඇසුරෙන් රචනා කරන ලද්දකි. එමෙන් ම මෙය පරිච්ඡේද 120ක් ද සූත්‍ර 30ක් ද ශරීර 6ක් ද නිදාන 16ක් ද චිකිත්සා 22ක් ද කල්ප 6ක් ද උත්තර 40ක් ද යනුවෙන් ප්‍රභේද 6කින් යුතු ය (Aṣṭānga Hṛdaya of vāgbhaṭa, Sūtrasthāna, 2013:Introduction.).

#### හේල සංහිතා

ආත්‍රේයගේ සිසුන් හය දෙනාගෙන් එකෙකු වූ හේල විසින් මෙය රචනා කරන ලදැයි විශ්වාස කෙරේ. කාලයාගේ ඇවෑමෙන් අවිද්‍යමාන වූ මෙම කෘතියෙහි ක්‍රි.ව. 1050 වන වර්ෂයේ ලියූ පිටපතක් කි.ව 1880 වර්ෂයේ දී සොයාගන්නා ලදි. එක ම සංස්කරණයක් වූ මෙහි අංග 8ක් ම දක්නට නො ලැබේ.

#### කාශ්‍යප සංහිතා

චරිම කාශ්‍යප මෙහි කතුවරයා වන අතර පිටපත් සොයා ගෙන ඇත්තේ වර්ෂ 1900 දී පමණ ය. මෙම කෘතියේ ප්‍රමුඛස්ථානය දී ඇත්තේ කෞමාරභෘත්‍යයට ය. එසේ හෙයින් කෞමාරභෘත්‍යය සම්බන්ධ ප්‍රධාන ග්‍රන්ථය මෙය යි. මෙම ග්‍රන්ථයෙහි ප්‍රධාන රෝග ප්‍රතිකාර අතර දරු ප්‍රසූතිය, ළදරු ආයුෂ අභිවර්ධනය, ළදරු ශාරීරික පෝෂණය, ළදරු රෝග ආදි විස්තර පිළිබඳ විවරණ විද්‍යමාන ය.

#### කල්‍යාණකාරක

උග්‍රාදිත්‍යාචාර්ය (Ugrādityācārya) විසින් මෙම ග්‍රන්ථය ක්‍රි.ව. 9 වැන්නෙහි රචනා කරන ලදි. මෙහි විවිධ ජෛනාචාර්යවරුන් පිළිබඳ ව ද තොරතුරු සඳහන් වේ (ගල්මංගොඩ, 2003:511). අෂ්ටාංගසංග්‍රහය ගුරු කොට ගෙන කල්‍යාණකාරකය රචනා වී ඇත. එසේ ම චරක හා සුශ්‍රැතසංහිතාවන්හි ඇසුර ද මෙම කෘතිය විෂයෙහි උපයුක්ත වී යැයි කීම යුක්ති යුක්ත ය. ජෛන ආගමේ මී පැණි භාවිතය තහනම් හෙයින් මෙම ග්‍රන්ථයෙහි උක් සකුරු රෝග සඳහා නිර්දේශිත ය. ආයුර්වේදයේ ඉගැන්වෙන අංග 8 ඇසුරු කොට ගෙන කාය චිකිත්සාව පිළිබඳ කරුණු සඳහන් ය. (Kalyāṇakārakam of Ugrahadityācārya:1940).

### මාධවනිධානය

මාධව විසින් රචිත මාධවනිධානය ක්‍රි.ව. 9-10 සියවස්වලට අයත් ය. එමෙන් ම මෙම ග්‍රන්ථය ලඝුත්‍රයී ගණයට ගැනේ. චරක හා සුශ්‍රැතසංහිතාවන්හි ඇතුළත් කරුණු ද විද්‍යමාන ය. මෙම කෘතියෙහි නිධාන නමින් හැඳින්වෙන රෝග නිධාන හා රෝග පිළිබඳ විස්තර ප්‍රමුඛ ව සඳහන් ය.

### අෂ්ටාංගසංග්‍රහය

වෘද්ධවාග්භට නමින් ද හඳුන්වන සිංහගුප්තගේ පුත්‍ර වූ වාග්භට නැමැත්තා මෙම කෘතියේ කතුවරයා ය. එමෙන් ම ඔහු බෞද්ධයෙකි. හෙතෙම ආරම්භක පද්‍ය ද්වයෙන් බුදුරදුන්ට නමස්කාරය පුදමින් චම්පු ලක්ෂණෝපේත ව අධ්‍යාය 150කින් සමන්විත අෂ්ටාංගසංග්‍රහය සම්පාදනය කළේය. මෙම ග්‍රන්ථය බොහෝ දෙනාගේ ගැරහීමට ලක් වූ හෙයින් විවේචක නම් කවියා විසින් අෂ්ටාංගහෘදයසංහිතා වශයෙන් නැවත සංස්කරණය කරන ලදි.

### භාවප්‍රකාශ නිඝණ්ඩුව

කාන්‍යකුබ්ජ වැසි භාවමිශ්‍ර විසින් ක්‍රි:ව: 16 වන සියවසේ දී මෙය රචනා කරන ලද අතර එම සියවසෙහි ම භාරතයට පැමිණි පරංගින්ගෙන් බෝ වූ ෆිරංගි රෝගය පිළිබඳ නිදාන සහ චිකිත්සා ක්‍රම, අබින්, කංසා, සීනල වැනි උසස් බෙහෙත් වර්ග, සන්නිපාතයේ ලක්ෂණ වූ ධාතු පාතය වැනි දෑ පිළිබඳ ව මෙහි විග්‍රහයට ලක් වූ ප්‍රධාන මාතෘකා ය.

මේ අනුව විමර්ශනය කරන විට ගම්‍ය වන්නේ ආයුර්වේදය විෂයෙහි රචිත චිකිත්සා, ශල්‍ය, ශාලාක්‍ය, භූත විද්‍යා, රසායන, වාජීකරණ ආදි මාතෘකා පිළිබඳ ලියැවුණු ග්‍රන්ථ රැසක් ම නෂ්ටප්‍රාප්ත වූ බව යි. ඊට හේතු වී ඇත්තේ ඒ තන්ත්‍ර පිළිබඳ සමාජයේ සැලකිලිමත් බවක් නොමැති වීම ය. වෘද්ධත්‍රයී ග්‍රන්ථ ප්‍රධාන වශයෙන් පාඨකයන් අතර ජනප්‍රිය වී භාවිත වීම ද මෙයට එක් හේතුවක් වි ය. එමෙන් ම මෙම ආයුර්වේද සාහිත්‍යයට ලියවුණු ග්‍රන්ථ අතර ටීකා සාහිත්‍යය ද වඩාත් වැදගත් තැනක් උසුලයි. එහෙත් එම ටීකාවෝ ද අභාවයට ගියහ. නූතනයේ පර්යේෂණ ස්වරූපයෙන් ලියැවුණු ආයුර්වේද ග්‍රන්ථ විරල ය. ඒවා හුදෙක් මුල් ග්‍රන්ථයන්හි දිගු ආකාරයෙන් රචනා වීම එයට හේතුවයි. සිද්ධාන්තනිධානය රචනා කළ ගණනාථසෙන් පඬිතුමාගේ ග්‍රන්ථය තරමක නව්‍යතාවකින් යුතු ය. කල්කටා ආයුර්වේද විද්‍යාලයේ අධිපති ජ්‍යාමිණී භූෂණරායි විසින් ද ආයුර්වේද ග්‍රන්ථ රැසක් ලියන ලදි. නව ග්‍රන්ථයක් ලිවීමට වඩා සිදු වී ඇත්තේ පැරණි ග්‍රන්ථ සිංහල, හින්දි, වංග, ඉංග්‍රීසි ආදි භාෂාවන්ට පරිවර්තනය කිරීම යි (ආයුර්වේද ශාස්ත්‍රය, 1962:45). පැරණි ආයුර්වේද ග්‍රන්ථ ඇසුරින් ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ද ආයුර්වේද සමීක්ෂා නම් වූ ශාස්ත්‍රීය සංග්‍රහයක් එළි දක්වා ඇත. එසේ ම ප්‍රසිද්ධ වූ එවැනි ග්‍රන්ථ 290ක පමණ නාම ලේඛන එහි දැක්වේ (ආයුර්වේද සමීක්ෂාව, පළමු වෙළුම පස්වන කලඹ, 1993:120).

### ආගමික සම්ප්‍රදායන්හි ආයුර්වේද සාහිත්‍යය

ආයුර්වේදය බිහි වීමෙන් පසු දර්ශන හා ශ්‍රමණ සම්ප්‍රදායෝ බිහි වූහ. එම ආගමික සම්ප්‍රදායන් සමඟ තදනුබද්ධ වී වර්ධනය වූ ආයුර්වේද අංගයෝ ඒ ඒ සම්ප්‍රදායන් මත පිහිටියහ. ඒ අතර විශේෂ වන්නේ බුදුදහම හා ජෛන සම්ප්‍රදාය යි. ආත්‍රේය, ධන්වන්තරී යන සම්ප්‍රදා ද්වයෙහි ම ඉගැන්වීම් තද් ජෛන සම්ප්‍රදායේ ද ඇතුළත් වේ. ජෛන ස්ථානාංග සූත්‍රයේ චිකිත්සාව හඳුන්වා ඇත්තේ පාපශ්‍රැත නවයෙන් එක් අංගයක් වශයෙනි. ජෛනයන්ගේ පිළිගැනීම වූයේ ධන්වන්තරී මෙම ශාස්ත්‍රයේ ප්‍රමුඛයා වූ බවත් එය හදාරන අයෙකුට වෛද්‍යවරයෙකු විය හැකි බවත් ය. ජෛන සම්ප්‍රදායේ ආයුර්වේද අංග අට මෙසේ ය.

1. කෞමාරභෘත්‍ය - (දරුවන් සම්බන්ධ රෝග සඳහා ප්‍රතිකාර)

2. ශාලාක්‍ය - (හිස ආශ්‍රිත රෝග සඳහා ප්‍රතිකාර)

3. ශල්‍යභෘත්‍ය - (තෘණකාෂ්ඨ, පාෂාණ, ලෝහ, අස්ථි, නිය ආදිය පිළිබඳ)

4. කායචිකිත්සා - (ජ්වර, අතිසාර ආදි රෝග සමනය කිරීම සඳහා)

5. ජාංගුලී

6. රසායන - (ආයුෂ, බුද්ධිය ආදිය වර්ධනය කිරීමේ තන්ත්‍ර)

7. වාජීකරණ - (වීර්ය වඩන ඖෂධ පිළිබඳ ශාස්ත්‍රය)

භූත විද්‍යාව වශයෙනි. (ආයුර්වේද සමීක්ෂාව, පළමු වෙලුම පස්වන කලඹ, 1993:124).

එමෙන් ම ජෛන බෘහත්කල්ප භාෂ්‍යයේ වාත, පිත, කැස්ස හා සන්නිපාතයෙන් ඇතිවන රෝග පිළිබඳ ව දැක් වේ. මෙයින් පැහැදිලි වන්නේ රෝග, රෝග හට ගැනීමේ හේතු, පඤ්චකර්ම ප්‍රතිකාර ක්‍රම, රෝග චිකිත්සා ක්‍රම ආදිය පිළිබඳ ජෛන සම්ප්‍රදායෙහි ද තොරතුරු කැටි ව ඇති බව යි.

නිවන් මඟෙහි ගමන් කරන පැවිදි හෝ ගිහි අයෙකුට පැවතිය යුතු ප්‍රධාන අරමුණක් වන්නේ සෞඛ්‍ය සම්පන්න බවින් යුතු වීම ය. භාවනාවේ යෙදෙන්නා මෙන් ම ධ්‍යානලාභියා ද මාර්ගඵල ලාභීයා ද පුහුදුන් පුද්ගලයා ද නීරෝගී බව තම ප්‍රධාන කාර්ය වශයෙන් සැලකිය යුතු යැයි බුදුරදුන් විසින් වදාරන ලදි. මානසික ඒකාග්‍රතාවයට අත්‍යවශ්‍ය වන්නේ සිතෙහි සංසිඳීම ය. ආධ්‍යාත්මික දියුණුව ඇති කරනු වස් මනෝචිකිත්සක ක්‍රම මෙන් ම ඖෂධමය චිකිත්සා ක්‍රම ද බුදුදහමෙහි භාවිත වේ. එමෙන් ම විනය පිටකාගත භේසජ්ජ ඛන්ධකයේ භික්ෂූන්ගේ රෝග සඳහා නියම කරන ලද ගිතෙල්, වෙඬරු, තල තෙල්, මී පැණි, හකුරු ආදි ආයුර්වේද නිර්දිෂ්ට ඖෂධ මෙන් ම පෝෂ්‍ය ගුණය සහිත ද්‍රව්‍ය අනු දැන වදාරණ ලදි. ඒ අතර ලෝණසෝවීරත වැනි ඖෂධයෝ ද නිර්දේශිත ය. මුගලන් හිමියන් සහ කාශ්‍යප හිමියන් රෝගාතුර වූ විට බුදු හිමියෝ උන්වහන්සේලා හට බෝධි අංග ධර්ම සිහිපත් කොට සත්‍ය ක්‍රියා කරවා රෝග සුව කරගන්නා අයුරු ඉගැන් වූහ. බුදුරදුන් රෝගාතුර වූ විටක චුන්ද හිමි විසින් සත්ත බොජ්ජංග දෙසා සුවපත් කළ බව බොජ්ඣඞ්ග සූත්‍රවල සඳහන් වේ. ගිරිමානන්ද භික්ෂුව රෝගාතුර වූ විට ආනන්ද හිමි දස සංඥා සිහිපත් කරවා ඉන් මුදවා ගත්තේ ය. මේ අයුරින් බුදුදහමේ ද ආධ්‍යාත්මික ශක්තියට වැඩි සැලකිල්ලක් දක්වා කායික, මානසික සුවතාව ලබාගන්නා ආකාරය විශද වේ. ගිරිමානන්ද සූත්‍රයේ වැළඳිය හැකි රෝග අවස්ථා රැසක් පෙන්වා දී ඇත. ඒ අතර රෝග නිධාන 8ක් ද දැක්වේ. මෙයින් පැහැදිලි වන්නේ බෞද්ධ සාහිත්‍යයේ ද රෝග අවස්ථා, රෝග ප්‍රතිකාර, ශරීර සුවතාව පවත්වා ගැනීම, රෝග ඇතිවීමේ හේතු වැනි දෑ සම්බන්ධ ව ප්‍රාමාණික විවරණ දක්වා ඇති බව ය.

## නිගමනය

ලොව සෑම විෂයක් ම වර්ෂ දහස් ගණනක් ඔස්සේ දිනෙන් දින දියුණුවට පත් වූ විෂයන් වශයෙන් ප්‍රකට ය. එම කාරණය හුදෙක් සාහිත්‍යයට ද ඒ අයුරින් ම පොදු ය. ඒ සාහිත්‍යය අතුරින් පෙරදිග චින්තාවේ සර්ව සංකල්ප ප්‍රදානය කළ සංස්කෘත සාහිත්‍යය වනාහි එකී සංවර්ධනයේ උපරිම ස්ථානය භජනය කරන්නකි. තත් සාහිත්‍යාංගයන්ගෙන් වේද සාහිත්‍යය ප්‍රධාන වන අතර වේදය ඇසුරු කොට ගෙන බිහි වූ බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් ආදිය ඔස්සේ වර්ධනය වූ සියලු ම ශාස්ත්‍ර වේදාංග නාමයෙන් නම්

කිරීමට කවි සමයේ මහත් උනන්දුවක් ඇති විය. නාට්‍ය සාහිත්‍යය, ආයුර්වේදය ආදිය පඤ්චම වේදය වශයෙන් හැඳින් වූයේ එයින් සමාජයට ලැබුණු සේවය අපමණ හෙයිනි. ආයුර්වේද සාහිත්‍යයේ විකාශනය හුදෙක් දේවවාදී වුව ද එහි ඵලය සමාජගත වූයේ මිනිසා කිසි දිනෙක නොසිතූ දියුණුවක් කරා පිය නඟිමිනි. වත්මන් සියලු රෝග සඳහා ඖෂධ සොයා ගැනීම දක්වා එහි ව්‍යාප්තිය තදබල ව සමාජ ගත විය. එසේ හෙයින් අනාගතයේ ද ආයුර්වේදය දීර්ඝායුෂ කරණයෙහි නියැළෙන්නා වූ ශ්‍රේෂ්ඨත ම සාහිත්‍යය වශයෙන් ලෝකයේ ප්‍රකට වනු ඇත.

## මූලාශ්‍රය

*ආයුර්වේද ශාස්ත්‍රය*, (1962), (සංස්.) කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*ආයුර්වේද සමීක්ෂාව පළමු වෙළුම*, (1993), (සංස්.) අමරසිරි පොන්නම්පෙරුම (කොළඹ 08: ආයුර්වේද දෙපාර්තමේන්තුව.

කුමාරසිංහ, ඒ. (1982), *ආයුර්වේද ඉතිහාසය*. ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව.

කුමාරසිංහ, ඒ. (1982), *ආයුර්වේද ඉතිහාසය*. ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව.

ගල්මංගොඩ, එස්. (2003), *ආයුර්වේද අධ්‍යයන ඉතිහාසය මූලධර්ම සහ සමගාමී සංකල්ප*. යක්කල: ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය.

ගුප්තා, බී, (2003), (පරි.). *ආයුර්වේදයේ ප්‍රාමාණික ඉතිහාසය*. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි. කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Bhishagratna, K. K. L. (ed.). (1907). *The Suśruta Saṃhitā*. Calcutta: K. K. L. Bhishagratna. Introduction.

Jain Bodnak & Veerawani. (ed.). (1940). *Kalyāṇakārakam of Ugrahadityācārya*. Sholapur: Seth Govindi Raoji Dositi.

Vidyanath, R. (ed.). (2013). *Aṣṭānga Hṛdaya of vāgbhaṭa, Sūtrasthāna*. Varanasi: Chaukhamba Surbharati Prakashan.